සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2020(I)**

| කාලය: පැය 03 | සංවර්ධන සැලසුම් ශිල්පක්‍රම (21) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |
|---|---|---|

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

1. අ) පහතින් දී ඇති සිද්ධිය කියවා ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය යොදාගනිමින් එහි ගැබ්වෙන ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනාගන්න.

**සිද්ධි 1: සරත් ගේ ව්‍යාපාරික අවස්ථාව**

සරත් මහනුවර නගරයට ආසන්න ප්‍රදේශයක ඔහුගේම ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඔහු ප්‍රධාන වශයෙන් දේශීය වෙළඳසැල් හරහා සංචාරකයින්ට අලෙවි කරන, සම්ප්‍රදායික ශෛලියකින් දේශීය රූකඩ සාදන ආබාධ සහිත පුද්ගලයින්ගේ එකතුවක් කළමනාකරණය කරන අතර ඔවුන්ට මූලික වැටුපක් මෙන්ම ලාභ කොටසක් ද ගෙවයි.

රූකඩ සියල්ලම සරත්ගේ ම මෝස්තරවලට සාදා ඇති අතර බොහෝ සංචාරක වෙළඳසැල්වල සම්මත අයිතමවලට වඩා බෙහෙවින් වෙනස් ය. ඔහුගේ විචිත්‍රවත් නිර්මාණ සහ සාප්පු සවාරි යන්නන් අතර ඒවා ජනප්‍රිය වීම, රූකඩ සහ සංචාරක හිතකාමී භාණ්ඩ නිෂ්පාදනය කරන සාපේක්ෂව විශාල කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන මුහන්දිරම් ගේ අවධානයට ලක්ව ඇත. මුහන්දිරම්, සරත්ගේ නිර්මාණ ඇතුළුව ඔහුගේ ව්‍යවසාය මිලදී ගන්නා ලෙස යෝජනා කිරීමටත්, සරත් සහ ඔහුගේ සේවකයින් සියල්ලෝම පැමිණ මුහන්දිරම්ගේ කම්හලේ වැඩ කරන ලෙසත් යෝජනා කරයි. ඔහු විශාල මුදලක් පිරිනැමීමට සුදානමින් සිටි. දැන් සරත්ට අවශ්‍ය වන්නේ ඔහුගේ ස්වාධීනත්වය පවත්වා ගැනීමටද නැතහොත් එකවර විශාල මුදලක් සහ සහතික කළ රැකියාවක් මගින් පිරිනමනු ලබන ආරක්ෂාව දැයි සරත් නොදනී. ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණයක් භාවිත කර වර්තමාන තත්ත්වය පිළිබඳව ක්ෂණික තීරණයකට එළඹීමට ඔහුට අවශ්‍ය වී ඇත. (ලකුණු 20)

ආ) තත්ත්ව විශ්ලේෂණ ශිල්පක්‍රමයක් ලෙස ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය යොදාගැනීමෙන් ගැටළුවට විසඳුම් සෙවීමේ දී ලබාගත හැකි ප්‍රයෝජන මොනවා දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 05)

2. අ) ඔබ ප්‍රදේශයේ හඳුනාගත් ගැටළුවක්, ගැටළු ගස (Problem Tree) ශිල්ප ක්‍රමය භාවිත කරමින් විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

ආ) ඔබ ගොඩනගාගත් ගැටළු ගස පදනම් කරගෙන අරමුණු ගස ගොඩනගන්න. (ලකුණු 08)

ඇ) ඉහත ආ). හි දී ගොඩනගන ලද අරමුණු ගස පදනම් කරගනිමින් ගැටළුවට විසඳුම් ලෙස ගත හැකි වඩාත් යෝග්‍ය උපායමාර්ග හඳුනාගන්න. (ලකුණු 07)

3. අ) තර්කරාමු විශ්ලේෂණය උදාහරණයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

ආ) අනෙකුත් විශ්ලේෂණ ශිල්පක්‍රමයන් ට වඩා තර්කරාමු ප්‍රවේශයේ ඇති වෙනස්කම් ඉහත 3 අ). ප්‍රශ්නයට ලබාදුන් පිළිතුර පදනම් කරගනිමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

4. අ) සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීමේ දී මූල්‍ය විශ්ලේෂණයක් කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ආ) පහත ශිල්පක්‍රම නිර්වචනය කර ඒවා ව්‍යාපෘතියක් තෝරාගැනීමේදී අදාළ කරගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

i. පිළි ගෙවුම් කාලය (Pay Back Period)

ii. ශුද්ධ වර්තමාන වටිනාකම (Net Present Value - NPV)

iii. ඡායා මිල (Shadow Price) (ලකුණු 5x3 = 15)

**************